Published in December 2010
© UNFPA, Sri Lanka

Concept, Design & Text by
Ms. Shamila Daluwatte, NPO Gender, UNFPA

Cartoons by
Ms. Damayanthi Muthukumarage

Printed with VOC free, non toxic vegetable oil-based environmentally-friendly ink.
Printed by Karunaratne & Sons (Pvt) Ltd. (info@karusons.com).

202, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, ශ්‍රී ලංකාව.
දුරකථන: 94-11-2552431, 94-11-2580840
ෆැක්ස්: 94-11-2580698 වෙබ්: www.unfpa.org

ස්ත්‍රීන්ට එරෙහිව සියළු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුතිය

එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල - ශ්‍රී ලංකාව

පටුන

පිටුව

1 වගන්තිය - ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් නවතමු 3
2 වගන්තිය - ස්ත්‍රීනට එරෙහි වෙනස්කම් පිටු දැකීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරමු 4
3 වගන්තිය - සමානාත්මතාව මත පිහිටා කාන්තාවන්ගේ මානව හිමිකම් තහවුරු කරමු 5
4 වගන්තිය - සැබෑ සමානාත්මතාවය ළඟා කරන ධනාත්මක විශේෂ ක්‍රියාමාර්ග ගනිමු 6
5 වගන්තිය - කාන්තාවන්ට එරෙහිව ඇති දුර්මත හා ලේබල් අහෝසි කරමු 7
6 වගන්තිය - කාන්තාවන් කුට්ටනය කිරීම හා වෙළෙඳාම නවතමු 8
7 වගන්තිය - ස්ත්‍රීන්ගේ දේශපාලන අයිතිය තහවුරු කරමු 9
8 වගන්තිය - ජාත්‍යන්තර මට්ටමේ නියෝජනය තහවුරු කරමු 10
9 වගන්තිය - ජාතිකත්වය හා පුරවැසිභාවය තහවුරු කරමු 11
10 වගන්තිය - අධ්‍යාපනයේ සමාන අවස්ථා සහතික කරමු 12
11 වගන්තිය - රැකියාවේ සම අයිතීන් තහවුරු කරමු 14
12 වගන්තිය - සෞඛ්‍ය අයිතීන් සුරකිමු 16
13 වගන්තිය - ආර්ථික සමාජීය ජීවිතයේ අයිතීන් සුරකිමු 17
14 වගන්තිය - ග්‍රාමීය කාන්තාවගේ අයිතීන් තහවුරු කරමු 18
15 වගන්තිය - නීතිය ඉදිරියේ සමානතාවය තහවුරු කරමු 20
16 වගන්තිය - විවාහය හා පවුල් ජීවිතය තුළ සමානාත්මතාවය තහවුරු කරමු 21

කෙටි හැඳින්වීම
ස්ත්‍රීන්ට එරෙහිව සියළු ආකාර වෙනස්කම් පිටුදැකීමේ සම්මුතිය

1 වගන්තිය - ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් නවතමු

ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් යනු විවාහක හෝ අවිවාහක තත්ත්වය නොසලකා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව මත පිහිටා දේශපාලන, ආර්ථික, සමාජයීය, සංස්කෘතික, සිවිල් හෝ වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක මානව අයිතිවාසිකම් හා මූලික නිදහස ස්ත්‍රීන් විසින් පිළිගැනීමේ, භුක්ති විඳීමේ හෝ භාවිතා කිරීමේ අයිතිය අහෝසි කිරීම හෝ බල රහිත කිරීම අරමුණු කර ගත් ස්ත්‍රී පුරුෂභාවය මත පදනම් වූ කවරාකාරයක හෝ වෙන්කොට සැලකීමක්, බැහැර කිරීමක් හෝ සීමා කිරීමක් හෝ වන්නේය.

"සමානාත්මතාවය හා සමාන ආරක්ෂාව පිළිබඳ ප්‍රතිපත්තීන් විසින් තහවුරු කර ඇති පරිදි කාන්තාවන්ට එරෙහිව සිදුවන සියළු ආකාරයේ හිංසනයන්, ඔවුන්ට එරෙහිව සිදු කෙරෙන වෙනස් කොට සැලකීම් ලෙස සලකා ක්‍රියා කළ යුතුය."

- රෂීඩා මන්ජෝ -

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු

2 වගන්තිය - ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් පිටු දැකීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරමු

- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳ මූලධර්ම ස්වකීය ව්‍යවස්ථාවෙහි හෝ අදාල වෙනත් අණ-පනත්වල ඇතුළත් කිරීම
- නීතිය හා වෙනත් යෝග්‍ය මාර්ග ඔස්සේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව මූලධර්මය ප්‍රායෝගිකව සාක්ෂාත් කර ගැනීමට සහතික වීම
- ස්ත්‍රීන්ට එරෙහිව සියළු ආකාර වෙනස්කම් තහනම් කරමින්, අවශ්‍ය තන්හි සුදුසු දඬුවම් ඇතුලත් යෝග්‍ය අණ-පනත් සහ වෙනත් ක්‍රියා මාර්ග සම්මත කොට ගැනීම
- පුරුෂයන් හා සමානව ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් සඳහා නෛතික ආරක්ෂාව සැලසීම
- ස්ත්‍රීන්ට එරෙහි කවරාකාරයක හෝ වෙනස් ලෙස සැලකීමේ ක්‍රියා වලින් මිදී සුදුසු ආරක්ෂාව ලබා ගැනීමේ අයිතිය නිසි බලතල සහිත ජාතික විනිශ්චය සභා සහ වෙනත් පොදු ආයතන මඟින් තහවුරු කිරීම
- ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් ගැබ් කොටගත් නීති රෙගුලාසි චාරිත්‍ර සහ පුරුදු සංශෝධනය හෝ අවලංගු කිරීම පිණිස නීති සම්පාදනය ඇතුළු යෝග්‍ය සියළු පියවර ගැනීම
- කවර හෝ පුද්ගලයකු සංවිධානයක් හෝ ව්‍යවසායක් විසින් ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් කිරීම පිටු දැකීම සඳහා සියළු යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීම
- ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම්වලට තුඩු දෙන සියලු ජාතික දණ්ඩ නීති විධිවිධාන අහෝසි කළ යුතුය

3 වගන්තිය - සමානාත්මතාව මත පිහිටා කාන්තාවන්ගේ මානව හිමිකම් තහවුරු කරමු

- පුරුෂයන් හා සමානවම දේශපාලන සමාජයීය ආර්ථික සහ සංස්කෘතික සියලු ක්ෂේත්‍ර වල මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස භාවිතා කිරීම හා භුක්ති විඳීම තහවුරු කිරීම
- ස්ත්‍රීන්ගේ පූර්ණ සංවර්ධනය සහ ප්‍රගමනය සහතික කරනු පිණිස ව්‍යවස්ථා සම්පාදනය ඇතුළුව සියලු පියවර ගත යුතුය

4 වගන්තිය - සැබෑ සමානාත්මතාවය ළඟා කරන ධනාත්මක විශේෂ ක්‍රියාමාර්ග ගනිමු

- ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර සැබෑ වශයෙන් දක්නට ලැබෙන සමානාත්මතාව ඇති කිරීම පිණිස පාර්ශ්වකාර රාජ්‍යයන් විසින් තාවකාලික විශේෂ ක්‍රියාමාර්ග සම්මත කොට ගත යුත්තේය
- සමාන ඉඩ ප්‍රස්ථා සැලසීම පිළිබඳ අරමුණ සාක්ෂාත් කර ගැනීමෙන් අනතුරුව එකී ක්‍රියාමාර්ග නතර කළ යුතු වන්නේය.
- මාතෘත්වය ආරක්ෂා කිරීමේ අරමුණින් විශේෂ ක්‍රියාමාර්ග පාර්ශ්වකාර රාජ්‍යයන් විසින් සම්මත කොට ගැනීම වෙනස් ලෙස සැලකීමක් සේ නොපිළිගැනෙයි.

"කාන්තාවන් සමනැන්හිලා සැලකීම සංවර්ධනයේ අත්‍යවශ්‍ය වූ මූලික අංගයක් බැව් බොහෝ රටවල් අවබෝධ කොට ගෙන තිබේ."

- කොෆි අනන් -

එක්සත් ජාතීන්ගේ මහ ලේකම්

5 වගන්තිය - කාන්තාවන්ට එරෙහිව ඇති දුර්මත හා ලේබල් අහෝසි කරමු

- ලිංග භේදය හෝ ස්ත්‍රීන්ට සහ පුරුෂයන්ට සමාජ හා සංස්කෘතිය විසින් පවරා ඇති හා චිරාගත කාර්යභාරයන් හා දැඩි ආකෘතින් තුළ සිර කරන ලද අගතිගාමී මත අනුව යමින් එකිනෙක පාර්ශ්වයේ උසස් පහත් බව රඳා පවතී යන අදහස මත පදනම් වු දුර්මත, චාරිත්‍ර සහ වෙනත් ව්‍යවහාරයන් අහෝසි කිරීමේ අදහස ඇතිව ස්ත්‍රීන්ගේ සහ පුරුෂයන්ගේ සමාජයීය සහ සංස්කෘතික චර්යා රටාවන් හැඩ ගැස්වීමට දායක වීම
- ඈත අතීතයේ සිට සෑම කල්හිම ළමයින්ගේ ඕනෑ එපාකම් ප්‍රමුඛස්ථානය ගත් බව තේරුම් ගෙන මාතෘත්වය හා දරු ප්‍රසූතිය සමාජ කාර්යයක් බවට නිසි අවබෝධයක් ලබා දීම
- ස්වකීය දරුවන් හදාවඩා ගැනීම හා සංවර්ධනය ස්ත්‍රීන් හා පුරුෂයන් යන දෙදෙනාගේම පොදු වගකීමක් බවට පිළිගැනීම තහවුරු කිරීම හා එකී අවබෝධය පවුල් අධ්‍යාපනයට ඇතුලත් කිරීමට සියලු පියවර ගැනීම

"නීති මගින් අගතීන් හා දුර්මත තුරන් කළ නොහැකි බව මා දනිමි. නමුත් අපගේ ක්‍රියාකාරකම්වලට නීති මගින් අවශ්‍ය වන මගපෙන්වීම කළ හැකිය."

- මෙල්වා ඈන් ලොක්වුඩ් - *ඇමෙරිකානු නීතිඥ හා දේශපාලනඥ*

6 වගන්තිය - කාන්තාවන් කුට්ටනය කිරීම හා වෙළෙඳාම නවතනු

සෑම ආකාරයකම ස්ත්‍රී වෙළෙඳාම, ජාවාරම් කිරීම හෝ කුට්ටනය කිරීම සහ ස්ත්‍රීන් ගණිකා වෘත්තියේ යොදවා සූරා කෑම මර්දනය කරනු පිණිස ව්‍යවස්ථා සම්පාදනය ඇතුළු යෝග්‍ය සියලු පියවර ගැනීම ගනු ඇත

"කිසිදු තැනක කිසිදු ආකාරයක හෝ කිසිදු දේශපාලන පක්ෂයක් හෝ රජයක් විසින් කාන්තාවන්ට එරෙහිව සිදු කරනු ලබන හිංසනය ඉවසිය යුතු නොවේ. එය පිටුදැකීමට අප සෑම එක්විය යුතුය."
*– **බන් කී මූන්** – එක්සත් ජාතීන්ගේ මහ ලේකම්*

7 වගන්තිය - ස්ත්‍රීන්ගේ දේශපාලන අයිතිය තහවුරු කරමු

- රටේ දේශපාලන සහ ජන ජීවිතයෙහි ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් පිටු දැකීමට යෝග්‍ය සියලු පියවර පුරුෂයන් හා සමානව දේශපාලනයේදී ස්ත්‍රීන්ටද සියලු ඡන්ද විමසීම්වල දී සහ ජනමත විචාරණවල දී ඡන්දය ප්‍රකාශ කිරීම
- ජනතා ඡන්දයෙන් නියෝජිතයන් තෝරා ගන්නා ආයතනවලට තේරී පත්වීම
- රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයෙහි සහ ක්‍රියාත්මක කිරීමෙහි ලා සහභාගී වීම
- රාජ්‍ය නිලතල හෙබවීමට හා රාජ්‍ය පාලනයේ සියලු මට්ටම්වල පොදු කාර්යයන්හි නිරතවීම
- රටේ දේශපාලන සහ ජන ජීවිතයට සම්බන්ධ රාජ්‍ය නොවන සංවිධානවලට හා සංගම්වලට සහභාගිවීම ඇතුළු සමාන අයිතිවාසිකම් සහතික කළ යුතුය.

"නීති සම්පාදන ක්‍රියාවලිය තුළ කාන්තාවන් සක්‍රිය ලෙස නියැලෙන තුරු කාන්තාවන් ඡන්ද බලයෙන් ජනතා නියෝජිතයන් ලෙස පත්වනතුරු කාන්තාවන් සඳහා පූර්ණ සමානාත්මතාවයක් දැකිය හැකි නොවේ"
*– **සුසාන් බී ඇන්තනී** – 19 වන සියවසේ කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරිනී*

8 වගන්තිය - ජාත්‍යන්තර මට්ටමේ නියෝජනය තහවුරු කරමු

- පුරුෂයන් හා සමානව කාන්තාවන්ටද කිසිදු වෙනස්කමකින් තොරව අන්තර්ජාතික තලයෙහි ස්වකීය ආණ්ඩු නියෝජනය කිරීම
- අන්තර්ජාතික සංවිධානවල ක්‍රියාකාරිත්වයට සහභාගිවීමේ අවස්ථා සහතික කරනු පිණිස යෝග්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම කල යුත්තේය.



9 වගන්තිය - ජාතිකත්වය හා පුරවැසිභාවය තහවුරු කරමු

- ස්වකීය ජාතිකත්වය අත්කර ගැනීමේ, වෙනස් කිරීමේ හෝ රඳවා ගැනීමේ ලා පුරුෂයන්ට හා සමාන අයිතිවාසිකම් ප්‍රදානය කිරීම
- විශේෂයෙන් විදේශිකයකු හා විවාහවීම නිසා හෝ විවාහයේදී ස්වාමිපුරුෂයා විසින් ජාතිකත්වය වෙනස්කිරීම නිසා හෝ භාර්යාවගේ ජාතිකත්වය ඉබේම වෙනස් වීමක් හෝ ඇයට රටවැසි භාවය අහිමිවීමක් හෝ ස්වාමි පුරුෂයාගේ ජාතිකත්වය බලහත්කාරයෙන් ඇය වෙත පැවරීමක් හෝ සිදු නොවන බවට රාජ්‍යයන් විසින් සහතික කිරීම
- ස්වකීය දරුවන්ගේ ජාතිකත්වය සම්බන්ධයෙන් පුරුෂයන්ට හා සමාන අයිතිවාසිකම් ස්ත්‍රීනට ප්‍රදානය කිරීම කළ යුතු වන්නේය.

"කාන්තාවක් ලෙස මට රටක් කියා නැත. සමස්ත ලෝකයම මගේ රටය"
*- **වර්ජිනියා වුල්ෆ්** - ඉංග්‍රීසි ගත්කතුවරියක්*

10 වගන්තිය - අධ්‍යාපනයේ සමාන අවස්ථා සහතික කරමු

- රැකියා සහ වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා සමාන අවස්ථා ලබා දීම
- නාගරබද මෙන්ම ගම්බද සියලු වර්ගවල අධ්‍යාපන ආයතනවලට පිවිසීමට හා ඩිප්ලෝමා ලබා ගැනීම සඳහා සමාන පහසුකම් ලබා දීම
- පෙර පාසල්, සාමාන්‍ය, තාක්ෂණික, වෘත්තීය ප්‍රවීණතා සහ උසස් තාක්ෂණික අධ්‍යාපනය හා සෑම ආකාරයකම වෘත්තීය පුහුණුව සහතික කිරීම
- එකම විෂයමාලාවන්ට, එකම විභාගවලට පෙනී සිටීමට, එකම මට්ටමේ සුදුසුකම් සහිත ආචාර්ය මණ්ඩලවල සේවාව ලබා ගැනීමට සහ එකම තත්වයේ පාසල් ගොඩනැගිලි හා උපකරණ ප්‍රයෝජනයට ගැනීම
- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟා වන ආකාරයට අධ්‍යාපනය දිරිගැන්වීමෙන් සහ පාඨ ග්‍රන්ථ සහ පාසල් වැඩ සටහන් සංශෝධනය කිරීමෙන් සහ ඉගැන්වීමේ ක්‍රම සකසා ගැනීම
- ස්ත්‍රීන්ගේ සහ පුරුෂයන්ගේ කාර්යභාරයන් පිළිබඳව එළඹ ඇති චිරාගත හානිදායක සංකල්පයන් සියලු මට්ටම්වල අධ්‍යාපනයෙන් පිටු දැකීම
- ශිෂ්‍යත්ව සහ වෙනත් අධ්‍යයන දීමනා ලබාගැනීමේ සමාන ඉඩ ප්‍රස්ථා ලබා දීම
- වැඩිහිටි සහ ව්‍යවහාරික සාක්ෂරතා දැනුම වර්ධනය කරන වැඩ සටහන් ඇතුළුව විශේෂයෙන් ස්ත්‍රීන් හා පුරුෂයන් අතර අධ්‍යාපනයෙහි පවත්නා පරතරය අඩු කිරීම අරමුණ කොටගත් අඛණ්ඩ අධ්‍යාපන වැඩ සටහන් වලට පිවිසීමේ සමාන ඉඩ ප්‍රස්ථා ලබා දීම

- ශිෂ්‍යාවන් පාසල් හැරයාමේ අනුපාතය අඩු කිරීම සහ නියමිත කාලයට පෙර පාසල් හැරගිය ගැහැණු ළමයින් සහ ස්ත්‍රීන් සඳහා වැඩ සටහන් සංවිධානය කිරීම
- ක්‍රීඩා වැඩසටහන් සහ ශාරීරික අධ්‍යාපනයට ක්‍රියාකාරීව සහභාගි වීමේ සමාන ඉඩ ප්‍රස්ථා ලබා දීම
- පවුල් සැලසුම් කිරීම පිළිබඳව තොරතුරු සහ උපදෙස් ඇතුළුව පවුල් සෞඛ්‍ය හා සුභසාධනය සහතික කිරීමට ඉවහල් වන සුවිශේෂ අධ්‍යාපනික තොරතුරු ලබා ගැනීමේ අවස්ථා සැලසීම
- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳ පදනම මත පිහිටා අධ්‍යාපන ක්ෂේත්‍රයේ සමාන අයිතිවාසිකම් තහවුරු කරනු පිණිස ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් පිටු දැකීමට අවශ්‍ය සියලු යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීම කළ යුතුය

"පුරුෂයෙකුගේ අධ්‍යාපනයේ වාසිය ඔහුටයි. කාන්තාවක්ගේ අධ්‍යාපනයේ වාසිය මුළු පවුලකටයි"
- ජී. ක්‍රිප්ස් -

II වගන්තිය - රැකියාවේ සම අයිතීන් තහවුරු කරමු

- එක හා සමාන වැඩ කිරීමට ඇති අයිතිය
- එකම රැකියා ඉඩ ප්‍රස්ථා ලබා ගැනීම සඳහා ඇති අයිතිය
- වෘත්තිය හෝ රැකියාව හෝ නිදහසේ තෝරා ගැනීමට ඇති අයිතිය
- උසස්වීම, රැකියාවේ සුරක්ෂිතභාවය හා සියලු ප්‍රතිලාභ සහ සේවා කොන්දේසි සඳහා ඇති අයිතිය
- ආධුනිකත්ව පුහුණුව හා වෘත්තිය පුහුණුව ලැබීමට ඇති අයිතිය
- ප්‍රතිලාභ ඇතුළුව සමාන වේතන ලැබීමට, සමාන වටිනාකම් සහිත වැඩ සම්බන්ධයෙන් සමානව සලකනු ලැබීමට ඇති අයිතිය
- සේවා තත්වය අගැයීමේදී සමානව සලකනු ලැබීමට ඇති අයිතිය
- විශේෂයෙන් විශ්‍රාම යාමේදී රැකියා විරහිත භාවයට, රෝගී භාවයට ආබාධිත තත්වයට මහළුවියට සහ වෙනත් දුබලතාවන්ට පත්වීමේ දී සමාජ ආරක්ෂණයට ඇති අයිතිය

- ප්‍රජනන කාර්යෙහිලා ආරක්ෂාව ඇතුළුව වෘත්තීය සෞඛ්‍ය සහ සේවා තත්වයන්හි සුරක්ෂිතභාවය සඳහා ඇති අයිතිය
- විවාහය හෝ මාතෘත්වය හෝ පදනම් කොටගෙන ස්ත්‍රීනට එරෙහිව කරන වෙනස්කම් වළක්වාලීම පිණිස සහ වැඩ කිරීමට ඔවුනට ඇති ඵලදායි අයිතිය සහතික කිරීම
- ගර්භනීභාවය හෝ ප්‍රසූත නිවාඩු හෝ විවාහක තත්වය පදනම් කොටගෙන සේවයෙන් පහ කිරීම තහනම් කිරීම
- කලින් කරන ලද රැකියාව, ජ්‍යෙෂ්ඨත්වය හෝ සමාජ ප්‍රතිලාභ අහිමිවීමක් නොමැතිව වැටුප් හා සමාන සමාජ ප්‍රතිලාභ සහිත ප්‍රසූත නිවාඩු ක්‍රම හඳුන්වා දීම
- පවුලේ වගකීම් සේවා ස්ථානයේ වගකීම් සමඟ බද්ධ කිරීමට දෙමාපියනට හැකිවනු පිණිස අවශ්‍ය උපකාරක සමාජ සේවා සම්පාදනය සහ විශේෂයෙන් දරුවන් රැකබලා ගැනීමේ පහසුකම් ජාලයක් ස්ථාපනය කිරීම පිණිස සියලු ක්‍රියාමාර්ග ගැනීම කළ යුත්තේය.

"ඔබට රැකියාවක් හෝ වගකීමක් දැරිය හැකිද යන්න තීරණය කරන්නේ ඔබගේ ක්‍රෝමසෝම ආකෘතිය අනුව නොවේ."
*– **බෙලා අබ්සුග්** – නීතිඥ හා ඇමෙරිකානු කොන්ග්‍රස් මන්ත්‍රීනී*

12 වගන්තිය - සෞඛ්‍ය අයිතීන් සුරකිමු

- පවුල් සැලසුම් කිරීම සම්බන්ධව සේවාවන් ඇතුළුව සෞඛ්‍ය සේවා පහසුකම් ලබා ගැනීම
- ගර්භනී සමය, දරු ප්‍රසූතිය සහ පශ්චාත් ප්‍රසූති සමය සම්බන්ධ යෝග්‍ය සේවාවන් සහ අවශ්‍ය තැන්හිදී නොමිලයේ සේවාවන් සහතික කිරීම
- ගර්භනී සහ කිරිදෙන කාලවලදී ප්‍රමාණවත් පෝෂණය සහතික කිරීම
- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳ පදනම මත පිහිටා සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රයෙහි ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් පිටු දැකීමට යෝග්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම කළ යුත්තේය

"ප්‍රජනන සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ කෙරෙන ආයෝජනයන් වැඩි ප්‍රතිලාභ හා ඉහළ ඵලදායිතාවයන් ඇති කරන අතර ආර්ථික වර්ධනයට මෙන්ම කාන්තා අයිතිවාසිකම්ද ප්‍රවර්ධනය කරයි."

- තොරායා අහමඩ් ඕබයිඩ් -

එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ විධායක අධ්‍යක්ෂිකා 2001 - 2010

13 වගන්තිය - ආර්ථික සමාජීය ජීවිතයේ අයිතීන් සුරකිමු

- පවුල් ප්‍රතිලාභ සඳහා ඇති අයිතිය
- බැංකු ණය, උකස් කර සහ වෙනත් ආකාරවල මූල්‍ය ණය පහසුකම් සඳහා ඇති අයිතිය
- විවේක සුව විඳීමට, ක්‍රීඩාවලට සහ සංස්කෘතික ජීවිතයේ වෙනත් අංශවලට සහභාගී වීමට ඇති අයිතිය
- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳ පදනම මත පිහිටා ආර්ථික සමාජයීය ජීවිතයේ ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් පිටු දැකීම සහතික කරනු වස් යෝග්‍ය සියලු පියවර ගනු ඇත්තේය

"කාන්තාවන් තවදුරටත් සුබසාධන ආධාර මත යැපෙන අක්‍රිය ජන කොටසක් නොවේ. ඔවුන් පුරුෂයින් හා සම සමව සක්‍රියව ක්‍රියා කරන ක්‍රියාකාරිණියන් බවට පත් වෙමින් සිටී. කාන්තාවන්ගේ මෙන්ම පුරුෂයින්ගේද ජීවිත වෙනස් කරන්නා වූ සමාජ පරිවර්තනය පෝෂණය කරන දැවැන්ත හස්තයක් බවට කාන්තාවන් පත්ව ඇත"

- අමර්ත්‍යා සෙන් - *ආර්ථික විශේෂඥ - 1999 නොබෙල් ත්‍යාගලාභී*

14 වගන්තිය - ග්‍රාමීය කාන්තාවගේ අයිතීන් තහවුරු කරමු

- ගම්බද ස්ත්‍රීන් මුහුණ පාන විශේෂ ගැටලු සහ ආර්ථිකයෙහි මුදල් වටිනාකම් ගණන් නොබැලෙන අංශවල ඔවුන්ගේ සේවාව ඇතුළුව ස්වකීය පවුල්වල ආර්ථික පැවැත්ම අරභයා ගම්බද ස්ත්‍රීන් විසින් ඉටු කැරෙන වැදගත් කාර්යභාරය සැලකිල්ලට ගැනීම
- ගම්බද ස්ත්‍රීන් ග්‍රාමීය සංවර්ධනයට සහභාගිවීම සහ ඉන් ප්‍රතිලාභ ලැබීම සහතික කරනු වස් ග්‍රාමීය ප්‍රදේශවල ස්ත්‍රීන්ට එරෙහි වෙනස් කම් පිටු දැකීම පිණිස යෝග්‍ය නිසි ක්‍රියාමාර්ග ගැනීම
- සියලු මට්ටම්වල සංවර්ධන සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේ දී සහභාගි වීම
- පවුල් සැලසුම් සේවා තොරතුරු සහ උපදේශනය ඇතුළුව ප්‍රමාණවත් සෞඛ්‍ය පහසුකම් ලැබීම
- සමාජ ආරක්ෂණ වැඩ සටහන්වලින් සෘජු ප්‍රතිලාභ ලැබීම

- විධිමත් සහ නොවිධිමත් සෑම ආකාරයකම පුහුණුව සහ අධ්‍යාපනය ලැබීම
- ස්වකීය තාක්ෂණික ප්‍රවීණතාව වර්ධනය කර ගනු පිණිස සියලු ප්‍රජා සහ බාහිර සේවාවන්ගෙන් ප්‍රතිලාභ ලැබීම
- ස්ව උපකාර කණ්ඩායම් සහ සමුපකාර සේවා සංවිධාන කිරීම තුළින් රැකියා හා ස්වයං රැකියා ඇතුළු ආර්ථික ඉඩ ප්‍රස්ථා සමානව හිමිකර දීම
- සියලු ප්‍රජා ක්‍රියාකාරකම්වලට සහභාගි වීම
- කෘෂිකාර්මික ණය, අලෙවි පහසුකම්, යෝග්‍ය තාක්ෂණය ලබා ගැනීමට සහ ඉඩම් සහ ගොවි ප්‍රතිසංස්කරණ වලදී මෙන්ම ජනපද ව්‍යාපාරවලදී ද සමානව සලකනු ලැබීම
- විශේෂයෙන් නිවාස, සනීපාරක්ෂාව, විදුලි බලය සහ ජලසම්පාදනය, ප්‍රවාහනය සහ සන්නිවේදන භුවමාරුව සම්බන්ධයෙන් ප්‍රමාණවත් ජීවන පහසුකම් භුක්ති විඳීමට ඇති අයිතිය සහතික කිරීමට යෝග්‍ය සියලු ක්‍රියාමාර්ග ගනු ඇත්තේය.

"පුංචි පුංචි දේ දසලක්ෂ සංඛ්‍යාත වාර ගණනින් සිදුවන විට එය මහා විශාල ශක්තියක් ලෙස නිර්මාණය වේ. එය මහා ආර්ථික ශක්තියක අත්තිවාරම වේ. කාන්තාවන් මෙම ආර්ථික අත්තිවාරම හොඳ තහන්නට පිළිපන් විට එය ඒ සා විශාල සමාජ ආර්ථික ප්‍රගමනයක මුල් පියවර වේ."

- මහාචාර්ය මුහම්මද් යුනුස් -

1998 නොබෙල් ත්‍යාගලාභී

15 වගන්තිය - නීතිය ඉදිරියේ සමානතාවය තහවුරු කරමු

- නීතිය හමුවෙහි පුරුෂයන් හා සමානව කාන්තාවන්ට සම තත්වය ප්‍රදානය කරනු ලැබීම
- සිවිල් කටයුතු සම්බන්ධයෙන් පුරුෂයන් හා හැම අතින්ම සමාන වූ නීතිමය බලය හා එකී බලය පරිහරණය සඳහා ස්ත්‍රීන්ට සම අවස්ථා සැලසීම
- කොන්ත්‍රාත් ගිවිස ගැනීමේ සහ දේපල පාලනය කිරීමේ සම අයිතිවාසිකම් ලබා දීම
- උසාවි සහ විනිශ්චය සභාවල ක්‍රියා පටිපාටියෙහි සියලු අවස්ථාවලදී සමානව සැලකීම
- ස්ත්‍රීන්ගේ නීතිමය බලය සීමා කිරීමට තුඩු දෙන නීතිමය ප්‍රතිවිපාකයන් සහිත සියලුම ගිවිසුම් සහ කවරාකාරයක හෝ සියලුම පෞද්ගලික ලේඛන අවලංගු හා නිශ්ක්‍රිය කිරීම
- පුද්ගලයන්ගේ ගමන් බිමන් සහ ස්වකීය නිවස්න තෝරා ගැනීමේ නිදහස සම්බන්ධ නීතිය විෂයෙහි ස්ත්‍රීනට සහ පුරුෂයනට එකම අයිතිවාසිකම් ප්‍රදානය කිරීම කල යුත්තේය.

"කිසියම් තැනක සිදුවන අසාධාරණය ලොව පුරා යුක්තියට තර්ජනයකි."

මාටින් ලූතර් කිං ජූනියර්

16 වගන්තිය - විවාහය හා පවුල් ජීවිතය තුළ සමානාත්මතාවය තහවුරු කරමු

- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳ පදනම මත පිහිටා විවාහය සහ පවුල් සම්බන්ධතාවලට අදාල සියලු කාර්යයන් හි දී ස්ත්‍රීනට එරෙහි වෙනස්කම් පිටු දැකීම
- විවාහයට ඇතුලත් වීමේ සමාන අයිතිය තහවුරු කිරීම
- නිදහසේ සහකරුවකු තෝරා ගැනීමේ සහ ඔවුනොවුන්ගේ නිදහස් සහ පූර්ණ කැමැත්ත ඇතිව පමණක් විවාහයට ඇතුළත්වීමේ අයිතිය තහවුරු කිරීම
- විවාහයේ දී සහ විවාහය අවලංගු කිරීමේ දි සමාන අයිතිවාසිකම් සහ වගකීම් සහතික කිරීම
- විවාහක අවිවාහක භාවය නොසලකා ස්වකීය දරුවන් හා සම්බන්ධ කටයුතුවලදී දෙමාපියන් වශයෙන් සෑමවිටම දරුවන්ගේ ඕනෑ එපාකම්වලට ඉහලම ප්‍රමුඛත්වය ඇතිව සමාන අයිතිවාසිකම් සහ වගකීම් ලබා දීම
- දරුවන්ගේ සංඛ්‍යාව සහ දරුවන් අතර පරතරය නිදහසේ සහ වගකීමෙන් යුතුව තීරණය කිරීමේ සම අයිතිය ලබා දීම
- පවුල් සැලසුම් සඳහා ඉවහල් වන තොරතුරු හා අධ්‍යාපනය වෙත ප්‍රවේශය ලබා ගැනීම සහතික කිරීම

- දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ වගකීම, භාරකාරත්වය, දරුකමට හදා ගැනීම සහ ඔවුන් රැකබලා ගැනීම සම්බන්ධයෙන් සමාන අයිතිවාසිකම් හා වගකීම් දෙපාර්ශ්වයටම තහවුරු කිරීම
- ඉහත කී සංකල්ප ජාතික අණපනත්වල ඇතුළත් කිරීම හා ඒවා ක්‍රියාත්මක කරන ආයතන සෑම විටම දරුවන්ගේ ඕනෑ එපාකම්වලට ප්‍රමුඛත්වය ඇතිව සමාන අයිතිය සහ වගකීම් තහවුරු කිරීම
- පවුල් නාමයක්, වෘත්තියක් සහ රැකියාවක් තෝරා ගැනීමේ අයිතිය ඇතුළුව සැමියා සහ භාර්යාව වශයෙන් හිමි සමාන පෞද්ගලික අයිතිවාසිකම් තහවුරු කිරීම
- දේපල හිමිකාරත්වය අත්කර ගැනීම, කළමනාකරණය, පරිපාලනය, භුක්ති විඳීම සහ විකිණීම සම්බන්ධයෙන් දෙපාර්ශ්වයටම සමාන අයිතිවාසිකම් සහතික කිරීම
- දරුවකුගේ විවාහ ගිවිස ගැනීමකට නීතිමය බලයක් නොමැති අතර විවාහය සඳහා අවම වයසක් නියම කිරීමටත් සියළු විවාහයන් ලියාපදිංචි කිරීම අනිවාර්ය කිරීමට නීති සම්පාදනය ඇතුළුව අවශ්‍ය සියලු පියවර ගැනීම කළ යුත්තේය.

"බිරිඳ සැමියාගේ වහලකු නොවේ. ඇය ඔහුගේ සහකාරිය හා මිතුරියයි."

- මහත්මා ගාන්ධි -

හැඳින්වීම

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 1979 දී සම්මත කොට ගන්නා ලද ස්ත්‍රීන්ට එරෙහි සියළු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුතිය ස්ත්‍රීන් පිළිබඳ අන්තර්ජාතික අයිතිවාසිකම් පනතක් ලෙස බොහෝ විට විස්තර කරනු ලැබේ. පූර්විකාවකින් සහ වගන්ති 30කින් සමන්විත එය ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් යනු කවරේදැයි අර්ථ නිරූපණය කොට එබඳු වෙනස්කම් අවසන් කිරීම පිණිස වන ජාතික ක්‍රියාකාරිත්වය උදෙසා න්‍යාය පත්‍රයක් සකසයි.

සම්මුතිය ප්‍රකාර ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් යනු ස්වකීය විවාහක තත්වය නොසලකා පුම්තිරි සමානාත්මතාව පිළිබඳ පදනමක් මත දේශපාලන, ආර්ථික, සමාජයීය, සිවිල් හෝ වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක මානව අයිතිවාසිකම් හා මූලික නිදහස ස්ත්‍රීන් විසින් පිළිගැනීම, භුක්ති විඳීම හෝ භාවිතයට බාධා කිරීම හෝ නිශ්ප්‍රභා කිරීම ප්‍රතිඵලය හෝ පරමාර්ථය කොටගත් ස්ත්‍රී පුරුෂ භේදය මත පදනම් වූ කවරාකාරයක හෝ විභේදනය හෝ නිශේධනය හෝ සීමා කිරීම හෝ වන්නේය.

රාජ්‍යයෝ සම්මුතිය පිළිගැනීමෙන් ස්ත්‍රීන්ට එරෙහි සෑම ආකාරයකම වෙනස්කම් පිටු දැකීම පිණිස පහත සඳහන් දේ ඇතුළු පියවර මාලාවක් ගැනීමට තමන්ම කැප වන්නාහ.

- ස්ත්‍රී පුරුෂ සාමානාත්මතාව පිළිබඳ මූලධර්මය ස්වකීය නීති පද්ධතියට සංයුක්ත කිරීම, වෙනස්කම් වලට තුඩුදෙන සියළු නීති අහෝසි කිරීම සහ ස්ත්‍රීනට එරෙහි වෙනස්කම් තහනම් කිරීම පිණිස යෝග්‍ය නීති සම්මත කිරීම
- වෙනස්කම් කරනු ලැබීමෙන් ස්ත්‍රීනට නිසි ආරක්ෂාව සලසනු වස් විනිශ්චය සභා සහ වෙනත් රාජ්‍ය ආයතන ස්ථාපනය කිරීම
- පුද්ගලයන්, සංවිධාන හෝ ව්‍යවසායයන් හෝ විසින් ස්ත්‍රීන්ට එරෙහිව කෙරෙන්නා වූ වෙනස්කම් පිටු දැකීම සහතික කිරීම

අධ්‍යාපනය සහ සේවා නියුක්තිය මෙන්ම ඡන්දය දීම හා මැතිවරණවලට ඉදිරිපත් වීම ඇතුළුව දේශපාලන සහ සමාජ ජීවිතයෙහි සමාන ප්‍රවේශයන් හා සමාන ඉඩ ප්‍රස්ථා සහතික කිරීමෙන් ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීම සඳහා පදනමක් සම්මුතියෙන් සැපයේ. ස්ත්‍රීනට ස්වකීය සියළු මානව හිමිකම් හා මූලික නිදහස භුක්ති විඳීමට හැකිවන අයුරින් ව්‍යවස්ථා සම්පාදනය හා තාවකාලික විශේෂ ක්‍රියාමාර්ග ඇතුළු යෝග්‍ය සියළු ක්‍රියාමාර්ග ගැනීමට පාර්ශවකාර රාජ්‍යයෝ එකඟ වෙති.

මෙම සම්මුතිය ස්ත්‍රීන්ගේ ප්‍රජනන අයිතිවාසිකම් තහවුරු කරන්නාවූත් පුම්තිරි කාර්යභාර්යන් සහ පවුල් සම්බන්ධතා හැඩ ගස්වන තීරණාත්මක බලවේග ලෙස සංස්කෘතිය සහ සම්ප්‍රදාය ඉලක්ක කර ගන්නා වූත් එකම මානව හිමිකම් ගිවිසුම වන්නේය. එය ස්වකීය ජාතිකත්වය සහ සිය දරුවන්ගේ ජාතිකත්වය අත්කර ගැනීමට වෙනස් කිරීමට හෝ රඳවා ගැනීමට ස්ත්‍රීන්ට ඇති අයිතිය පිළිගනී. සෑම ආකාරයකම ස්ත්‍රී වෙළඳාමට සහ ස්ත්‍රීන් සූරාකෑමට එරෙහිව යෝග්‍ය පියවර ගැනීමට ද පාර්ශවකාර රාජ්‍යයෝ එකඟ වෙති.

සම්මුතිය සපථ කල හෝ ඊට පිවිසුනා වූ හෝ රටවල් එහි එන විධිවිධාන භාවිතයට නැගීමට නීතියෙන් බැඳී සිටී. ස්වකීය ගිවිසුම් වගකීම් සපුරාලීමට තමන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳවල අඩුම වශයෙන් සෑම අවුරුදු හතරකටම වරක් ජාතික වාර්තා ඉදිරිපත් කිරීමටද ඔව්හු කැපවී සිටිති.

1981 සැප්තැම්බර් 03 වැනිදා ක්‍රියාත්මක වූ සම්මුතිය 1996 මැයි 31 වනවිට එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් 152 ක් විසින් සපථ කැර තිබිණ.

ස්ත්‍රීනට එරෙහි සියලු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුතිය

තත් සම්මුතියේ පාර්ශවකාර රාජ්‍යයෝ

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය තුළින් මූලික මානව අයිතිවාසිකම් මනුෂ්‍යයාගේ අභිමානය සහ අගය සහ ස්ත්‍රීන්ගේ සහ පුරුෂයන්ගේ සමාන අයිතිවාසිකම් කෙරෙහි විශ්වාසය යළි තහවුරු කර ඇති බව සටහන් කරමින්,

මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය වෙනස් ලෙස සැලකීම නොපිළිගැනීමේ මූලධර්මය තහවුරු කර ඇති බව සියළු මනුෂ්‍යයන් අභිමානය සහ අයිතිවාසිකම් අතින් සමානව නිදහස් ව උපත ලබා ඇති අතර පුම්තිරිභාවය පිළිබඳ කිසිදු භේදයක් නැතිව ප්‍රකාශනයේ අන්තර්ගත සියළු අයිතිවාසිකම් සහ නිදහස සියළු දෙනාට හිමිවන බව ප්‍රකාශ කර ඇති බව සටහන් කරමින්,

මානව අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතින්ගේ පාර්ශ්වකාර රාජ්‍යයන් ස්ත්‍රීනට සහ පුරුෂයනට සියළු ආර්ථික, සාමාජයීය, සංස්කෘතික සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමේ සමාන අයිතිය සහතික කිරීමේ වගකීමෙන් බැඳී සිටින බව සටහන් කරමින්,

ස්ත්‍රීන්ගේ සහ පුරුෂයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සමානාත්මතාවට අනුබල දෙමින් එක්සත් ජාතීන්ගේ සහ විශේෂිත ආයතනවල මෙහෙයවීමෙන් සම්පාදිත අන්තර්ජාතික සම්මුතීන් සැලකිල්ලට ගනිමින්,

කෙසේ වතුදු, මෙකී විවිධ ලේඛන තිබියදී පවා ස්ත්‍රීනට එරෙහි වෙනස්කම් විශාල වශයෙන් දිගටම සිදුවීම ගැන සැලකිලිමත් වෙමින්,

ස්ත්‍රීනට එරෙහිව වෙනස්කම් කිරීම අයිතිවාසිකම් වල සමානාත්මතාව පිළිබඳ මූලධර්මය සහ මානව අභිමානය කෙරෙහි ගෞරවය උල්ලංඝනය කිරීමක් බව පුරුෂයන් හා සමානව සිය රටෙහි දේශපාලන, සමාජීය, ආර්ථික හා සංස්කෘතික ජීවිතයට සහභාගි වීමට ස්ත්‍රීන්ට ඇති බාධාවක් බව සමාජයේ සහ පවුලේ සෞඛ්‍යය, අභිවෘද්ධිය අඩාල කරන බව සහ තම රටේ සහ මානව සංහතියේ සේවය සඳහා ස්ත්‍රීන් සතු ශක්‍යතාවන්හි පූර්ණ සංවර්ධනයක් අත්කර ගැනීම අඩාල කරන බව සිහිපත් කරමින්,

දරිද්‍රතාව පවතින අවස්ථාවල ආහාර, සෞඛ්‍ය, අධ්‍යාපනය, පුහුණුව සහ රැකියා ඉඩ ප්‍රස්ථා සහ වෙනත් අවශ්‍යතා සපුරාගැනීම සඳහා අඩුම ඉඩකඩක් ඇත්තේ ස්ත්‍රීන්ට බව සැලකිල්ලට ගනිමින්,

සමානාත්මතාව සහ යුක්තිය මත පදනම් වූ නව අන්තර්ජාතික ආර්ථික රටාවක් ස්ථාපනය කිරීම ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර සමානාත්මතාවට බොහෝ සෙයින් දායක වන බව ඒත්තු ගෙන,

වර්ණභේද වාදය, සෑම ආකාරයකම වර්ගවාදය, වර්ගවාදී වෙනස්කම්, යටත් විජිතවාදය, නව යටත් විජිතවාදය, විදේශීය ග්‍රහණය සහ ආධිපත්‍ය හා රාජ්‍යයන්ගේ අභ්‍යන්තර කටයුතු වලට මැදිහත් වීම තුරන් කර දැමීම ස්ත්‍රීන්ගේ සහ පුරුෂයන්ගේ අයිතිවාසිකම් පූර්ණ ලෙස භුක්ති විඳීමට අත්‍යවශ්‍ය බව අවධාරණය කරමින්,

අන්තර් ජාතික සාමය හා ආරක්ෂාව ශක්තිමත් කිරීම, අන්තර්ජාතික නොසන්සුන්තාව සමනය කරමින් සාමාජයීය හා ආර්ථික ක්‍රම පිළිබඳ වෙනස්කම් නොසලකා සියළු රාජ්‍යයන් අතර අන්‍යෝන්‍ය සහයෝගීතාව දැඩි හා ඵලදායි අන්තර්ජාතික පාලනය යටතේ කෙරෙන පොදු හා පූර්ණ නිරායුධකරණය, විශේෂයෙන් න්‍යෂ්ටික නිරායුධකරණය රටවල් අතර සම්බන්ධතාවන් හී සාධාරණත්වය සමානාත්මතාව සහ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ පිළිබඳ මූලධර්ම පිළිගැනීම සහ විදේශීය හා යටත් විජිත ආධිපත්‍යයට සහ විදේශීය ග්‍රහණයට යටත්ව සිටින ජනතාවන්ට ස්වයං තීරණය සහ ස්වාධීනත්වය සඳහා ඇති අයිතිය සාක්ෂාත් කර ගැනීම මෙන්ම ජාතික ස්වාධිපත්‍යයට හා භෞමික අඛණ්ඩතාවට ගරු කිරීම මඟින් සමාජ ප්‍රගමනය හා සංවර්ධනය අභිවර්ධනය වන බවත් එහි ප්‍රතිඵල ස්ත්‍රීන් හා පුරුෂයන් අතර පූර්ණ සමානාත්මතාව අත්කර ගැනීමට ඉවහල් වන බවත් සපථ කරමින්,

රටක පරිපූර්ණ සංවර්ධනය ලෝකයේ සුභ සිද්ධිය සහ සාම ක්‍රියාදාමය උදෙසා සෑම ක්ෂේත්‍රයකම පිරිමින් හා සමානව ස්ත්‍රීන්ගේද උපරිම සහභාගිත්වය අවශ්‍ය බව චිත්තු ගනිමින්,

මෙතෙක් පූර්ණ පිළිගැනීමට ලක්ව නැති, පවුලේ සුභ සිද්ධිය හා සමාජයේ සංවර්ධනය උදෙසා වන ස්ත්‍රීන්ගේ මහඟු දායකත්වය මාතෘත්වයේ සාමාජයීය වැදගත්කම සහ පවුලෙහි සහ දරුවන් හදා වඩා ගැනිමෙහි ලා මාපියන්ගේ කාර්යභාරය සිත තබා ගනිමින්,

දරුවන් බිහි කිරීමෙහි ලා ස්ත්‍රීන්ගේ කාර්යභාරය වෙනස් ලෙස සැලකීමට පදනමක් නොවිය යුතු යයිද එහෙත් දරුවන් හදා වඩා ගැනිමෙහි ලා ස්ත්‍රීන් සහ පුරුෂයන් සේම සමස්ත සමාජයද වගකීම බෙදා ගැනීම අවශ්‍යයයිද සිත තබා ගනිමින්,

ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර පූර්ණ සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීමට සමාජයෙහි සහ පවුලෙහි පුරුෂයන්ගේ මෙන්ම ස්ත්‍රීන්ගේ ද සාම්ප්‍රදායික කාර්යභාරයෙහි වෙනසක් අවශ්‍ය බව අවබෝධ කොට ගෙන,

ස්ත්‍රීනට එරෙහි වෙනස්කම් පිටු දැකීම පිළිබඳ ප්‍රකාශනයේ සඳහන් පිළිවෙත් ක්‍රියාත්මක කිරීමට අදිටන් කොටගෙන ඒ අරමුණ උදෙසා එකී වෙනස්කම්වල සියළු ආකාර ස්වරූපයන් හා ප්‍රකාශනයන් අහෝසි කිරීමට අවශ්‍ය පියවර සම්මත කොට ගැනීම පිණිස පහත සඳහන් අයුරු එකඟ වූහ.

1. වගන්තිය

තත් සම්මුතියෙහි ඇතුළත් පරමාර්ථ විෂයෙහි, ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම්, යන පදයෙහි අර්ථය, ස්වකීය විවාහක තත්ත්වය නොසලකා, පුම්ස්ත්‍රී සමානාත්මතාව පිළිබඳ පදනමක් මත, දේශපාලන ආර්ථික, සමාජයීය, සංස්කෘතික සිවිල් හෝ වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක මානව අයිතිවාසිකම් හා මූලික නිදහස ස්ත්‍රීන් විසින් පිළිගැනීම, භුක්ති විඳීම හෝ භාවිතයට බාධා කිරීම හෝ නිශ්ප්‍රභා කිරීම, ප්‍රතිඵලය හෝ පරමාර්ථය කොටගත් ස්ත්‍රී පුරුෂ භේදය මත පදනම් වූ කවරාකාරයක හෝ විභේදනය, නිශේධනය හෝ සීමා කිරීම හෝ වන්නේය.

2. වගන්තිය

ස්ත්‍රීන්ට එරෙහි සියළු ආකාරයේ වෙනස්කම් හෙලා දකින පාර්ශ්වකාර රාජ්‍යයෝ, ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් පිටු දැකීමේ ප්‍රතිපත්තියක් සියළුම යෝග්‍ය මාර්ග භාවිතා කරමින් සහ අප්‍රමාදව අනුගමනය කිරීමට එකඟ වෙමින් ඒ අරමුණ සපුරාගනු වස් :

(අ) ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳ මූලධර්ම ස්වකීය ව්‍යවස්ථාවන්හි හෝ අදාල වෙනත් අණපනත්වල හෝ තවමත් ඇතුළත් කර නැත්නම් ඒවායේ ඇතුළත් කිරීමට සහ නීතිය හා වෙනත් යෝග්‍ය මාර්ග ඔස්සේ මේ මූලධර්මය ප්‍රායෝගිකව සාක්ෂාත් කර ගැනීම සහතික කිරීමට ද

(ආ) ස්ත්‍රීනට එරෙහිව සියළු ආකාර වෙනස්කම් තහනම් කරමින්, අවශ්‍ය තන්හි සුදුසු දඬුවම් ඇතුළත් යෝග්‍ය අණපනත් සහ වෙනත් ක්‍රියා මාර්ග සම්මත කොට ගැනීමද

(ඇ) පුරුෂයන්ට හා සමාන පදනමකින් ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් සඳහා නෛතික ආරක්ෂාව සැලසීමට සහ නිසි බලතල සහිත ජාතික විනිශ්චය සභා සහ වෙනත් පොදු ආයතන මඟින් කවරාකාරයක හෝ වෙනස් ලෙස සැලකීමේ ක්‍රියාවකින් ස්ත්‍රීන්ට නිසි ආරක්ෂාව සැලසීම සහතික කිරීමටද

(ඉ) කවර හෝ පුද්ගලයකු සංවිධානයක් හෝ ව්‍යවසායක් විසින් ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් කිරීම පිටු දැකීම සඳහා සියළු යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ද

(ඊ) ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් ගැබ් කොටගත් දැනට පවත්නා නීති රෙගුලාසි චාරිත්‍ර සහ පුරුදු සංශෝධනය හෝ අවලංගු කිරීම පිණිස නීති සම්පාදනය ඇතුළු යෝග්‍ය සියළු පියවර ගැනීමට ද

(උ) ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම්වලට තුඩු දෙන සියලු ජාතික දණ්ඩ නීති විධිවිධාන අහෝසි කිරීමටද

3. වගන්තිය

පාර්ශ්වකාර රාජ්‍යයන් සියලු ක්ෂේත්‍රවල විශේෂයෙන් දේශපාලන සමාජයීය ආර්ථික සහ සංස්කෘතික ක්ෂේත්‍රවල පුරුෂයන් හා සමානාත්මතාව මත පදනම්ව මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස පරිහරණය හා භුක්ති විඳීම තහවුරු කරනු වස් ස්ත්‍රීන්ගේ පූර්ණ සංවර්ධනය සහ ප්‍රගමනය සහතික කරනු පිණිස ව්‍යවස්ථා සම්පාදනය ඇතුළුව සියලු පියවර ගනු ඇත.

4. වගන්තිය

1. ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර තත්‍යය වූ සමානාත්මතාව ඇති කිරීම පිණිස පාර්ශ්වකාර රාජ්‍යයන් විසින් සම්මත කොට ගනු ලබන විශේෂ ක්‍රියාමාර්ග තත් සම්මුතියේ අර්ථ නිරූපණය කොට ඇති පරිදි වෙනස් ලෙස සැලකීමක් සේ නොපිළිගැනෙනු ඇත. එසේ නමුත් එමඟින් ජනිත ප්‍රතිඵලයක් වශයෙන් අසමාන හෝ වෙනස් හෝ ප්‍රමිතීන් පවත්වාගෙන යාම කිසිලෙසකිනුත් කළ නොහැකි වන්නේය. සමාන ඉඩ ප්‍රස්ථා සැලසීම පිළිබඳ අරමුණ සාක්ෂාත් කර ගැනීමෙන් අනතුරුව එකී ක්‍රියාමාර්ග නතර කළ යුතු වන්නේය.

2. මාතෘත්වය ආරක්ෂා කිරීමේ අරමුණින් තත් සම්මුතියේ ඇතුළත් ක්‍රියාමාර්ග ඇතුළුව විශේෂ ක්‍රියාමාර්ග පාර්ශ්වකාර රාජ්‍යයන් විසින් සම්මත කොට ගැනීම වෙනස් ලෙස සැලකීමක් සේ නොපිළිගැනෙයි

5. වගන්තිය

පාර්ශ්වකාර රාජ්‍යයන් විසින්

(අ) ලිංග භේදය හෝ ස්ත්‍රීන්ට සහ පුරුෂයන්ට පැවරී ඇති චිරාගත කාර්යභාරයන් හෝ අනුව එකිනෙක පාර්ශ්වයේ උසස් පහත් බව රඳා පවතී යන අදහස මත පදනම් වූ දුර්මත චාරිත්‍ර සහ වෙනත් ව්‍යවහාරයන් අහෝසි කිරීමේ අදහස ඇතිව ස්ත්‍රීන්ගේ සහ පුරුෂයන්ගේ සමාජයීය සහ සංස්කෘතික චර්යා රටාවන් හැඩ ගැස්වීම

(ආ) ඈත අතීතයේ සිට සෑම කල්හිම ළමයින්ගේ ඕනෑ එපාකම් ප්‍රමුඛස්ථානය ගත් බව තේරුම් ගෙන මාතෘත්වය සමාජ කාර්යයක් බවට නිසි අවබෝධයක් සහ ස්වකීය දරුවන් හදාවඩා ගැනීම හා සංවර්ධනය ස්ත්‍රීන්ගේ හා පුරුෂයන්ගේ පොදු වගකීමක් බවට පිළිගැනීම පවුල් අධ්‍යාපනයෙහි ඇතුළත් වන බව සහතික කිරීම: සඳහා යෝග්‍ය සියලු පියවර ගනු ඇත.

6. වගන්තිය

පාර්ශ්වකාර රාජ්‍යයන්, සෑම ආකාරයකම ස්ත්‍රී වෙළෙඳාම සහ ස්ත්‍රීන් ගණිකා වෘත්තියේ යෙදැවීමෙන් වාසි ලැබීම මර්දනය කරනු පිණිස ව්‍යවස්ථා සම්පාදනය ඇතුළු යෝග්‍ය සියලු පියවර ගනු ඇත.

7. වගන්තිය

පාර්ශ්වකාර රාජ්‍යයයන් රටේ දේශපාලන සහ ජන ජීවිතයෙහි ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් පිටු දැකීමට යෝග්‍ය සියලු පියවරගනු ඇති අතර විශේෂයෙන්, පුරුෂයන් හා සමානව ස්ත්‍රීන්ටද:

(අ) සියලු ඡන්ද විමසීම්වල දී සහ ජනමත විචාරණවල දී ඡන්දය ප්‍රකාශ කිරීමට සහ ජනතා ඡන්දයෙන් නියෝජිතයන් තෝරා ගන්නා ආයතනවලට තේරී පත්වීමට

(ආ) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයෙ හි සහ ක්‍රියාත්මක කිරීමෙහි ලා සහභාගි වීමට රාජ්‍ය නිලතල හෙබැවීමට, රාජ්‍ය පාලනයේ සියලු මට්ටම් වල පොදු කාර්යයන්හි නිරතවීමට

(ඇ) රටේ දේශපාලන සහ ජනජීවිතයට සම්බන්ධ රාජ්‍ය නොවන සංවිධානවලට හා සංගම්වලට සහභාගිවීමට: සමාන අයිතිවාසිකම් සහතික කරනු ඇත.

8. වගන්තිය

පාර්ශ්වකාර රාජ්‍යයන්, පුරුෂයන් හා සමානව සහ කිසිදු වෙනස්කමකින් තොරව ස්ත්‍රීන්ට අන්තර්ජාතික තලයෙහි ස්වකීය ආණ්ඩු නියෝජනය කිරීමේ සහ අන්තර්ජාතික සංවිධානවල ක්‍රියාකාරීත්වයට සහභාගිවීමේ අවස්ථා සහතික කරනු පිණිස යෝග්‍ය සියලු ක්‍රියාමාර්ග ගනු ඇත.

9. වගන්තිය

1. පාර්ශ්වකාර රාජ්‍යයන්, ස්ත්‍රීන්ට ස්වකීය ජාතිකත්වය අත්කර ගැනීමේ වෙනස් කිරීමේ හෝ රඳවා ගැනීමේ ලා පුරුෂයන්ට හා සමාන අයිතිවාසිකම් ප්‍රදානය කළයුතු වන්නේය. විශේෂයෙන් විදේශිකයකු හා විවාහවීම නිසා හෝ විවාහයේදී ස්වාමිපුරුෂයා විසින් ජාතිකත්වය වෙනස්කිරීම නිසා හෝ භාර්යාවගේ ජාතිකත්වය ඉබේම වෙනස් වීමක් හෝ ඇයට රටවැසි භාවය අහිමිවීමක් හෝ ස්වාමි පුරුෂයාගේ ජාතිකත්වය බලහත්කාරයෙන් ඇය වෙත පැවරීමක් හෝ සිදු නොවන බව රාජ්‍යයන් විසින් සහතික කළ යුත්තේය.

2. පාර්ශ්වකාර රාජ්‍යයන්, ස්වකීය දරුවන්ගේ ජාතිකත්වය සම්බන්ධයෙන් පුරුෂයන්ට හා සමාන අයිතිවාසිකම් ස්ත්‍රීන්ට ප්‍රදානය කළ යුතු වන්නේය.

III කොටස

10. වගන්තිය

පාර්ශ්වකාර රාජ්‍යයන්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳ පදනම මත අධ්‍යාපන ක්ෂේත්‍රයේ ස්ත්‍රීන්ට පිරිමින්ට සමාන අයිතිවාසිකම් තහවුරු කරනු පිණිස ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් පිටු දැකීමට අවශ්‍ය සියලු යෝග්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත්තේය. විශේෂයෙන්ම,

(අ) රැකියා සහ වෘත්තීය මාර්ගෝපදේශනය, අධ්‍යයන කාර්යයන්ට ප්‍රවිෂ්ට වීම සහ නගරබද මෙන්ම ගම්බද සියලු වර්ගවල අධ්‍යාපන ආයතනයන් හි ඩිප්ලෝමා ලබා ගැනීම සඳහා සමාන පහසුකම් ලබාදිය යුතුය: මේ සාමානාත්මතාව පෙර පාසල්, සාමාන්‍ය, තාක්ෂණික, වෘත්තීය ප්‍රවීණතා සහ උසස් තාක්ෂණික වෘත්තිය ප්‍රවීණතා සහ උසස් තාක්ෂණික අධ්‍යාපනය සඳහා මෙන්ම සෑම ආකාරයකම වෘත්තීය පුහුණුව සඳහා ද සහතික කළ යුතු වන්නේය.

(ආ) එකම විෂයමාලාවන්ට එකම විභාගවලට පෙනී සිටීම, එකම මට්ටමේ සුදුසුකම් සහිත ආචාර්ය මණ්ඩලවල සේවාව ලබා ගැනීම සහ එකම තත්වයේ පාසල් ගොඩනැගිලි හා උපකරණ ප්‍රයෝජනයට ගැනීම.

(ඇ) මිශ්‍ර අධ්‍යාපනය සහ අදාල අරමුණ සපුරා ගැනීමට ඉවහල් වන වෙනත් ආකාර වල අධ්‍යාපනය දිරිගැන්වීමෙන් සහ පාඨ ග්‍රන්ථ සහ පාසල් වැඩ

සටහන් සංශෝධනය කිරීමෙන් සහ ඉගැන්වීමේ ක්‍රම සකසා ගැනීමෙන් ස්ත්‍රීන්ගේ සහ පුරුෂයන්ගේ කාර්යභාරයන් පිළිබඳ ඕනෑම විරාගත සංකල්පයක් සියලු මට්ටම්වල සහ සියලු ආකාරවල අධ්‍යාපනයෙන් පිටු දැකීම:

(ඈ) ශිෂ්‍යත්ව සහ වෙනත් අධ්‍යයන දීමනා ලබාගැනීමේ සමාන ඉඩ ප්‍රස්ථා :

(ඉ) වැඩිහිටි සහ කාර්ය නියුක්ත සාක්ෂරතා වැඩ සටහන් ඇතුළුව විශේෂයෙන් ස්ත්‍රීන් හා පුරුෂයන් අතර අධ්‍යාපනයෙහි පවත්නා පරතරය හැකි අඩුම කාලයක් ඇතුළත අඩු කිරීම අරමුණ කොටගත් අඛණ්ඩ අධ්‍යාපන වැඩ සටහන්වලට පිවිසීමේ සමාන ඉඩ ප්‍රස්ථා

(ඊ) ශිෂ්‍යාවන් පාසල් හැරයාමේ අනුපාතය අඩු කිරීම සහ නියමිත කාලයට පෙර පාසල් හැරගිය ගැහැණු ළමයින් සහ ස්ත්‍රීන් සඳහා වැඩ සටහන් සංවිධානය:

(උ) ක්‍රීඩා වැඩසටහන් සහ ශාරීරික අධ්‍යාපනයට ක්‍රියාකාරීව සහභාගී වීමේ සමාන ඉඩ ප්‍රස්ථා

(ඌ) පවුල් සැලසුම් කිරීම පිළිබඳව තොරතුරු සහ උපදෙස් ඇතුළුව පවුල් සෞඛ්‍ය හා සුභසාධනය සහතික කිරීමට ඉවහල් වන සුවිශේෂ අධ්‍යාපනික තොරතුරු ලබා ගැනීමේ අවස්ථා සැලසීම

11. වගන්තිය

1. පාර්ශ්වකාර රාජ්‍යයන්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳ පදනම මත- සේවා නියුක්ති ක්ෂේත්‍රයෙහි ස්ත්‍රීනට එරෙහි වෙනස්කම් පිටු දැකීම පිණිස එකම අයිතිවාසිකම්, විශේෂයෙන්,

(අ) සියලු මනුෂ්‍යයන් සතු පැහැර ගත නොහැකි අයිතියක් ලෙස වැඩ කිරීමට ඇති අයිතිය:

(ආ) සේවා නියුක්තිය සඳහා තෝරා ගැනීම්වල දී එකම නිර්ණායක භාවිතය ඇතුළුව එකම රැකියා ඉඩ ප්‍රස්ථා සඳහා ඇති අයිතිය :

(ඇ) වෘත්තිය හෝ රැකියාව හෝ නිදහසේ තෝරා ගැනීමට ඇති අයිතිය, උසස්වීම, රැකියාවේ සුරක්ෂිතභාවය සහ සියලු ප්‍රතිලාභ සහ සේවා කොන්දේසි සඳහා ඇති අයිතිය සහ ආධුනිකත්ව පුහුණුව, උසස් වෘත්තිය පුහුණුව සහ පුනරාවර්තන පුහුණුව ඇතුළුව වෘත්තිය පුහුණුව ලැබීමට සහ පවත්වා ගැනීමට ඇති අයිතිය

(ඈ) ප්‍රතිලාභ ඇතුළුව සමාන වේතන ලැබීමට, සමාන වටිනාකම් සහිත වැඩ සම්බන්ධයෙන් සමානව සලකනු ලැබීමට මෙන්ම සේවා තත්වය අගැයීමේදී සමානව සලකනු ලැබීමට ඇති අයිතිය

(ඉ) විශේෂයෙන් විශ්‍රාම යාමේදී රැකියා විරහිත භාවයට, රෝගී භාවයට ආබාධිත තත්ත්වයට, මහළුවියට සහ වෙනත් දුබලතාවන්ට පත්වීමේ දී සමාජ ආරක්ෂණයට ඇති අයිතිය මෙන්ම වැටුප් සහිත නිවාඩු සඳහා ඇති අයිතිය

(ඊ) ප්‍රජනන කාර්යෙහිලා ආරක්ෂාව ඇතුළුව සෞඛ්‍ය ආරක්ෂාවට සහ සේවා තත්වයන්හි සුරක්ෂිතභාවය සඳහා ඇති අයිතිය : සහතික කිරීම පිණිස යෝග්‍ය සියලු ක්‍රියාමාර්ග ගනු ඇත්තේය.

2. විවාහය හෝ මාතෘත්වය හෝ පදනම් කොටගෙන ස්ත්‍රීන්ට එරෙහිව කරන වෙනස්කම් වළක්වාලීම පිණිස සහ වැඩ කිරීමට ඔවුනට ඇති ඵලදායි අයිතිය සහතික කරනු වස් පාර්ශ්වකාර රාජ්‍යයන් :

(අ) ගර්භනීභාවය හෝ ප්‍රසූත නිවාඩු හෝ හේතුකොට ගෙන සේවයෙන් පහ කිරීම සහ විවාහක තත්ත්වය පදනම් කොටගෙන සේවයෙන් පහ කිරීමේදී වෙනස් ලෙස සැලකීම දඬුවම් පැමිණවීමට යටත්ව තහනම් කිරීමට:

(ආ) කලින් කළ රැකියාව ජ්‍යෙෂ්ඨත්වය හෝ සමාජ ප්‍රතිලාභ හෝ අහිමිවීමක් නොමැතිව වැටුප් හෝ සමාන සමාජ ප්‍රතිලාභ හෝ සහිත ප්‍රසූත නිවාඩු ක්‍රම හඳුන්වා දීමට:

(ඇ) පවුලේ වගකීම් සේවා ස්ථානයේ වගකීම් සමඟ බද්ධ කිරීමට දෙමාපියනට හැකිවනු පිණිස අවශ්‍ය උපකාරක සමාජ සේවා සම්පාදනය සහ විශේෂයෙන් දරුවන් රැකබලා ගැනීමේ පහසුකම් ජාලයක් ස්ථාපනය සහ සංවර්ධනය මඟින් ජන ජීවිතයට සහභාගිවීම දිරිගැන්වීමට :

(ඈ) ගර්භනී සමයෙහි ස්ත්‍රීන්ට හානිකර වේ යයි සනාථ වී ඇති සේවා කාර්යයන් හි නිරතවන සියලු ක්‍රියාමාර්ග ගනු ඇත්තේය.

3. මේ වගන්තියෙන් ආවරණය වන කරුණු හා සම්බන්ධව ආරක්ෂාකාරී අණපනත් විද්‍යාත්මක හා තාක්ෂණික ව්‍යුහය මත පදනම්ව කලින් කලට සමාලෝචනය කිරීම සහ අවශ්‍යතාව අනුව සංශෝධනය නිශේධනය හෝ දීර්ඝ කිරීම හෝ කළ යුතු වන්නේය.

12 වගන්තිය

1. පාර්ශ්වකාර රාජ්‍යයන්, පවුල් සැලසුම් කිරීම සම්බන්ධව සේවාවන් ඇතුළුව සෞඛ්‍ය සේවා පහසුකම් ලබා ගැනීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳ පදනම මත සහතික කරනු පිණිස සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රයෙහි ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් පිටු දැකීමට යෝග්‍ය සියලු ක්‍රියාමාර්ග ගනු ඇත්තේය.

2. පාර්ශ්වකාර රාජ්‍යයන්, මේ වගන්තියේ පළමුවැනි ඡේදයේ විධි විධාන නොසලකා ගර්භනී සමය, දරු ප්‍රසූතිය සහ පශ්චාත් ප්‍රසූති සමය සම්බන්ධ යෝග්‍ය සේවාවන් සහ අවශ්‍ය තැන්හිදී නොමිලයේ සේවාවන් සහතික කිරීමත් ගර්භනී සහ කිරිදෙන කාලවලදී ප්‍රමාණවත් පෝෂණය සහතික කිරීමත් කළයුතු වන්නේය.

13 වගන්තිය

පාර්ශ්වකාර රාජ්‍යයන්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳ පදනම මත ආර්ථික සමාජයීය ජීවිතයේ ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් පිටු දැකීම පිණිස, ඇති අයිතිවාසිකම්, විශේෂයෙන් :

(අ) පවුල් ප්‍රතිලාභ සඳහා ඇති අයිතිය

(ආ) බැංකු ණය, උකස් කර සහ වෙනත් ආකාරවල මූල්‍ය ණය පහසුකම් සඳහා ඇති අයිතිය

(ඇ) විවේක සුව විඳීමට, ක්‍රීඩා වලට සහ සංස්කෘතික ජීවිතයේ වෙනත් අංශවලට සහභාගී වීමට ඇති අයිතිය සහතික කරනු වස් යෝග්‍ය සියලු පියවර ගනු ඇත්තේය

14. වගන්තිය

1. පාර්ශ්වකාර රාජ්‍යයන්, ගම්බද ස්ත්‍රීන් මුහුණ පාන විශේෂ ගැටලු සහ ආර්ථිකයෙහි මුදල් වටිනාකම් ගණන් නොබැලෙන අංශවල ඔවුන්ගේ සේවාව ඇතුළුව ස්වකීය පවුල්වල ආර්ථික පැවැත්ම අරභයා ගම්බද ස්ත්‍රීන් විසින් ඉටු කැරෙන වැදගත් කාර්යභාරය සැලකිල්ලට ගෙන තත් සම්මුතියේ ඇතුළත් විධි විධාන ගම්බද ප්‍රදේශවල ස්ත්‍රීන්ට වලංගු වීම සහතික කරනු වස් යෝග්‍ය සියලු ක්‍රියාමාර්ග ගනු ඇත්තේය.

2. පාර්ශ්වකාර රාජ්‍යයන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳ පදනම මත ගම්බද ස්ත්‍රීන් ග්‍රාමීය සංවර්ධනයට සහභාගිවීම සහ ඉන් ප්‍රතිලාභ ලැබීම සහතික කරනු වස් ග්‍රාමීය ප්‍රදේශවල ස්ත්‍රීනට එරෙහි වෙනස්කම් පිටු දැකීම පිණිස යෝග්‍ය හිසි ක්‍රියාමාර්ග ගන්නා අතර විශේෂයෙන් එබඳු ස්ත්‍රීනට :

(අ) සියලු මට්ටම්වල සංවර්ධන සැලසුම් විභාග කොට දැක්වීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී සහභාගි වීමට

(ආ) පවුල් සැලසුම් සේවා තොරතුරු සහ උපදේශනය ඇතුළුව ප්‍රමාණවත් සෞඛ්‍ය පහසුකම් ලැබීමට

(ඇ) සමාජ ආරක්ෂණ වැඩ සටහන් වලින් සෘජුවම ප්‍රතිලාභ ලැබීමට

(ඈ) කාර්ය නියුක්ත සාක්ෂරතාවට අදාල දේ ඇතුළුව විධිමත් සහ නොවිධිමත් සෑම ආකාරයකම පුහුණුව සහ අධ්‍යාපනය ලැබීමට මෙන්ම අනෙකුත් දේ අතර ස්වකීය තාක්ෂණික ප්‍රවීණතාව වර්ධනය පිණිස සියළු ප්‍රජා සහ ව්‍යාප්ති සේවාවන්ගේ ප්‍රතිලාභ ලැබීමට

(ඉ) රැකියාව හෝ ස්වයං රැකියාව හෝ මඟින් ආර්ථික ඉඩ ප්‍රස්ථා සමානව හිමිකර ගැනීම පිණිස ස්ව උපකාර කණ්ඩායම් සහ සමුපකාර සේවා සංවිධානයට

(ඊ) සියලු ප්‍රජා ක්‍රියාකාරකම්වලට සහභාගිවීමට

(උ) කෘෂිකාර්මික ණය, අලෙවි පහසුකම්, යෝග්‍ය තාක්ෂණය ලබා ගැනීමට සහ ඉඩම් සහ ගොවි ප්‍රතිසංස්කරණ වලදී මෙන්ම ජනපද ව්‍යාපාරවලදී ද සමානව සලකනු ලැබීමට

(ඌ) විශේෂයෙන් නිවාස, සනීපාරක්ෂාව, විදුලි බලය සහ ජලසම්පාදනය, ප්‍රවාහනය සහ පණිවිඩ හුවමාරුව සම්බන්ධයෙන් ප්‍රමාණවත් ජීවන පහසුකම් භුක්ති විඳීමට : ඇති අයිතිය සහතික කළ යුතු වන්නේය.

IV කොටස

15 වගන්තිය

1. පාර්ශ්වකාර රාජ්‍යයන්, නීතිය හමුවෙහි පුරුෂයන් හා සම තත්ත්වය ප්‍රදානය කරනු ඇත්තේය.

2. පාර්ශ්වකාර රාජ්‍යයන් සිවිල් කටයුතු සම්බන්ධයෙන් පුරුෂයන් හා හැම අතින්ම සමාන වූ නීතිමය බලය හා එකී බලය පරිහරණය සඳහා ස්ත්‍රීන්ට සම අවස්ථා සැලසිය යුත්තේය. විශේෂයෙන් කොන්ත්‍රාත් ගිවිස ගැනීමේ සහ දේපල පාලනය කිරීමේ සම අයිතිවාසිකම් දිය යුතු වන අතර උසාවි සහ විනිශ්චය සභාවල ක්‍රියා පටිපාටියෙහි සියලු අවස්ථාවලදී සමානව සැලකිය යුතු වන්නේය.

3. පාර්ශ්වකාර රාජ්‍යයෝ ස්ත්‍රීන්ගේ නෛතික බලය සීමා කිරීමට තුඩු දෙන නෛතික ප්‍රතිවිපාකයක් සහිත සියලුම ගිවිසුම් සහ කවරාකාරයක හෝ සියලුම පෞද්ගලික ලේඛන අවලංගු හා නිශ්ක්‍රිය සේ සැලකීමට එකඟ වන්නාහ.

4. පාර්ශ්වකාර රාජ්‍යයන්, පුද්ගලයන්ගේ ගමන් බිමන් සහ ස්වකීය නිවස්න තෝරා ගැනීමේ නිදහස සම්බන්ධ නීතිය විෂයෙහි ස්ත්‍රීන්ට සහ පුරුෂයනට එකම අයිතිවාසිකම් ප්‍රදානය කරනු ඇත්තේය.

16. වගන්තිය

1. පාර්ශ්වකාර රාජ්‍යයන්, විවාහය සහ පවුල් සම්බන්ධතාවලට අදාල සියලු කාර්යයන් හි දී ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් පිටු දැකීම පිණිස සහ විශේෂයෙන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව පිළිබඳ පදනම මත

(අ) විවාහයට ඇතුළත් වීමේ සමාන අයිතිය

(ආ) නිදහසේ සහකරුවකු තෝරා ගැනීමේ සහ ඔවුනොවුන්ගේ නිදහස් සහ පූර්ණ කැමැත්ත ඇතිව පමණක් විවාහයට ඇතුළත්වීමේ අයිතිය

(ඇ) විවාහයේ දී සහ විවාහය අවලංගු කිරීමේ දී සමාන අයිතිවාසිකම් සහ වගකීම්

(ඈ) විවාහක අවිවාහක භාවය නොසලකා ස්වකීය දරුවන් හා සම්බන්ධ කටයුතුවලදී දෙමාපියන් වශයෙන් සෑමවිටම දරුවන්ගේ ඕනෑ එපාකම්වලට ඉහළම ප්‍රමුඛත්වය ඇතිව සමාන අයිතිවාසිකම් සහ වගකීම්

(ඉ) දරුවන්ගේ සංඛ්‍යාව සහ දරුවන් අතර පරතරය නිදහසේ සහ වගකීමෙන් යුතුව තීරණය කිරීමේ සම අයිතිය සහ එකී අයිතිය පරිහරණය සඳහා ඉවහල් වන තොරතුරු අධ්‍යාපනය සහ වෙනත් ක්‍රම අත්කර ගැනීම

(ඊ) දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ වගකීම, කැපකරු තත්වය, භාරකාරත්වය සහ ඔවුන් රැකබලා ගැනීම සම්බන්ධයෙන් හෝ මෙකී සංකල්ප ජාතික අණපනත් වල ඇතුළත්ව ඇති විට එකී ආයතන සම්බන්ධයෙන් සෑම විටම දරුවන්ගේ ඕනෑ එපාකම්වලට ප්‍රමුඛත්වය ඇතිව සමාන අයිතිය සහ වගකීම්

(උ) පවුල් නාමයක්, වෘත්තියක් සහ රැකියාවක් තෝරා ගැනීමේ අයිතිය ඇතුළුව ස්වාමි පුරුෂයා සහ භාර්යාව වශයෙන් සමාන පෞද්ගලික අයිතිවාසිකම්

(ඌ) නොමිලයේ හෝ වටිනාකම ගෙවීමෙන් දේපල හිමිකාරත්වය අත්කර ගැනීම, කළමනාකරණය, පරිපාලනය භුක්ති විඳීම සහ විකිණීම සම්බන්ධයෙන් කලත්‍රයන් දෙදෙනාට සමාන අයිතිවාසිකම් : සහතික කිරීමට යෝග්‍ය සියලු ක්‍රියාමාර්ග ගනු ඇත්තේය.

V කොටස

17 වගන්තිය

1. තත් සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සලකා බැලීම සඳහා සම්මුතිය ක්‍රියාත්මක වන අවස්ථාවේදී, උසස් සද්වර්යාවෙන් යුත්, සම්මුතියෙන් ආවරණය වන ක්ෂේත්‍රයේ නිපුණත්වයක් සහිත විශේෂඥයන් දහ අට දෙනෙකුගෙන් ද, 35 වැනි පාර්ශ්වකාර රාජ්‍යය සම්මුතිය සපථ කිරීමෙන් හෝ පිළිගැනිමෙන් හෝ අනතුරුව 23 දෙනෙකුගෙන් ද සැදුම්ලත් ස්ත්‍රීන්ට එරෙහි වෙනස්කම් පිටු දැකීමේ කමිටුවක් (මින් මතු කමිටුව යයි හැඳින්වෙන) ස්ථාපනය කළ යුත්තේය. පාර්ශ්වකාර රාජ්‍යයන් සමාන භූගෝලීය ව්‍යාප්තිය, ශිෂ්ටාචාරයන් හා විවිධ ධාරාවන් මෙන්ම ප්‍රධාන නීති පද්ධතීන් ද නියෝජනය වීම සලකා බලමින් සිය ජාතිකයන් අතරින් විශේෂඥයන් තෝරාගත යුතු අතර ඔවුහු සිය පෞද්ගලික මට්ටමින් සේවය කළ යුත්තාහ.

2. පාර්ශ්වකාර රාජ්‍යයන් විසින් නම් කැරෙන පුද්ගලයන්ගේ ලේඛනයකින් රහසිගත ඡන්දයෙන් කමිටුවේ සාමාජිකයන් තෝරා ගත යුතුය. සෑම පාර්ශ්වකාර රාජ්‍යයකටම තම ජාතිකයන් අතරින් එක් පුද්ගලයකු නම් කළ හැකිය.

3. තත් සම්මුතිය ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට හය මසකට පසුව ප්‍රථම ඡන්ද විමසීම පැවැත්වෙනු ඇත. ඡන්ද විමසීම සිදු කෙරෙන දිනට අවම වශයෙන් තුන් මසකට පෙර එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා විසින් පාර්ශ්වකාර රාජ්‍යයන් වෙත යැවෙන ලිපියකින් දෙමසක් ඇතුළත නාම යෝජනා ඉදිරිපත් කරන ලෙස ඇරයුම් කළ යුත්තේය. මහ ලේකම්වරයා නම් යෝජනා කරනු ලැබූවන්ගේ ලේඛනයක් එසේ නම් යෝජනා කළ රාජ්‍ය පාර්ශ්වයන් ද පෙන්නුම් කරමින්, අකාරාදිය අනුව පිළියෙළ කොට පාර්ශ්වකාර රාජ්‍යයන් වෙත ඉදිරිපත් කළ යුත්තේය.

4. මහ ලේකම්වරයාගේ කැඳවීමෙන් එක්සත් ජාතීන්ගේ මූලස්ථානයෙහි පැවැත්වෙන පාර්ශ්වකාර රාජ්‍යයන්ගේ රැස්වීමකදී කමිටුවේ සාමාජිකයන් තේරීම සිදු කෙරනු ඇත. ගණ පූර්ණය සඳහා පාර්ශ්වකාර රාජ්‍යයන්ගෙන් තුනෙන් දෙකක සහභාගිත්වය අවශ්‍ය ය. එකී රැස්වීමේ දී කමිටුවට තෝරාගනු ලබන පුද්ගලයන් වන්නේ රැස්වීමට සහභාගි වී ඡන්දය ප්‍රකාශ කරන පාර්ශ්වකාර රාජ්‍ය නියෝජිතයන්ගේ ඡන්දයෙන් වැඩිම ඡන්ද සංඛ්‍යාව සහ නිශ්චිත බහුතරයක් ලබා ගන්නා නාම යෝජිතයන්ය.

5. කමිටුවේ සාමාජිකයන් සිවු අවුරුදු කාල සීමාවක් සඳහා තෝරාගනු ඇත. එසේ වුවද, ප්‍රථම ඡන්ද විමසීමේ දී තෝරා ගැනෙන සාමාජිකයන් 9 දෙනෙකුගේ නිල කාලය අවුරුදු දෙකක් අවසානයේ නිමා වෙයි. ප්‍රථම ඡන්ද විමසීම අවසාන වූ වහාම කමිටුවේ සභාපතිවරයා විසින් කුසපත් ඇදීමෙන් මේ සාමාජිකයෝ 9 දෙනා තෝරා ගැනෙති.

6. කමිටුවේ අතිරේක සාමාජිකයන් 5 දෙනා ඡන්දයෙන් තෝරා ගැනීම 35 වැනි සපථ කිරීමෙන් හෝ පිළිගැනීමෙන් හෝ අනතුරුව මේ වගන්තියේ 2, 3 සහ 4 ඡේදවල සඳහන් විධිවිධාන ප්‍රකාර සිදුකළ යුත්තේය. මේ අවස්ථාවේදී තෝරා ගැනෙන අතිරේක සාමාජිකයන්ගෙන් දෙදෙනෙකුගේ නිල කාලය අවුරුදු දෙකක් අවසානයේ නිමවන අතර එකී සාමාජිකයෝ දෙදෙනා කමිටුවේ සභාපතිවරයා විසින් කුසපත් ඇදීමෙන් නම් කෙරති.

7. අනියම් පුරප්පාඩු පිරවීම සඳහා කමිටුවේ සාමාජිකයකු ලෙස ක්‍රියා කිරීම අවසන් කල විශේෂඥයා අයත් පාර්ශ්වකාර රාජ්‍යය කමිටුවේ අනුමැතියට යටත්ව සිය ජාතිකයන් අතරින් වෙනත් විශේෂඥයකු නම් කළ යුතුය.

8. කමිටුවේ වගකීම් භාරයේ වැදගත්කම සැලකිල්ලට ගෙන මහා මණ්ඩලය විසින් තීරණය කැරෙන නියමයන් සහ කොන්දේසි ප්‍රකාර මහා මණ්ඩලයේ අනුමැතිය ඇතිව කමිටුවේ සාමාජිකයනට එක්සත් ජාතීන්ගේ සම්පත්වලින් වේතන ගෙවිය යුත්තේය.

9. තත් සම්මුතිය යටතේ කමිටුවේ කාර්යයන් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල සහ පහසුකම් එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා විසින් සැපයෙනු ඇත.

18 වගන්තිය

1. පාර්ශ්වකාර රාජ්‍යයෝ තත් සම්මුතියෙහි ඇතුළත් විධි විධාන ක්‍රියාවට නැංවීම පිණිස තමන් විසින් සම්මත කොටගත් ව්‍යවස්ථාමය, අධිකරණමය, පරිපාලනමය හෝ වෙනත් ක්‍රියාමාර්ග හෝ පිළිබඳව සහ ඒ සම්බන්ධයෙන් අත්කර ගත් ප්‍රගතිය පිළිබඳව වාර්තාවක්

(අ) අදාල රාජ්‍යය සඳහා සම්මුතිය ක්‍රියාත්මක වූ දින සිට වර්ෂයක් ඇතුළත සහ

(ආ) ඉන් පසුව අවම වශයෙන් සෑම සිව් වසරකටම වරක් සහ කමිටුව එසේ ඉල්ලා සිටින සෑම විටම කමිටුව විසින් සලකා බලනු පිණිස එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීමට ප්‍රතිඥා දෙති.

2. තත් සම්මුතිය යටතේ වගකීම් ඉටුකර ඇති ප්‍රමාණය කෙරෙහි බලපෑ සාධක සහ දුෂ්කරතා වාර්තාවේ සඳහන් කිරීමට පිළිවන.

19 වගන්තිය

1. කමිටුව තමන්ගේම පටිපාටිමය නීති සම්මත කරගනු ඇත.

2. කමිටුව දෑ අවුරුදු නිල කාලයක් සඳහා සිය නිලධාරීන් තෝරාගනු ඇත.

20 වගන්තිය

1. තත් සම්මුතියෙහි 18 වන වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කෙරෙන වාර්තා සලකා බැලීම පිණිස කමිටුව අවුරුදු පතා වරකට සති දෙකකට නොවැඩි කාලයකට රැස්වනු ඇත්තේය.

2. කමිටු රැස්වීම සාමාන්‍යයෙන් එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේදී හෝ කමිටුව නිශ්චය කරන වෙනත් පහසු ස්ථානයක හෝ පැවැත්වෙනු ඇත්තේය.

21 වගන්තිය

1. කමිටුව සිය ක්‍රියාකාරකම් පිළිබඳව ආර්ථික සහ සමාජයීය මණ්ඩලය මඟින් වාර්ෂිකව එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයට වාර්තා කළයුතු වන අතර පාර්ශ්වකාර රාජ්‍යයන් වෙතින් ලැබුණු වාර්තා හා තොරතුරු විමර්ශනය පදනම් කොටගෙන යෝජනා සහ පොදු නිර්දේශ ඉදිරිපත් කිරීමට ඊට හැකියාව ඇත්තේය. එබඳු යෝජනා සහ පොදු නිර්දේශ පාර්ශ්වකාර රාජ්‍යයන්ගෙන් පල වූ යම් අදහසක් වේනොත් ඒවාද සමඟ කමිටුවේ වාර්තාවට ඇතුළත් කළ යුතු වන්නේය.

2. මහ ලේකම්වරයා කමිටු වාර්තා ස්ත්‍රීන්ගේ තත්ත්වය පිළිබඳ කොමිසම වෙත එහි දැනගැනීම පිණිස යැවිය යුත්තේය.

22 වගන්තිය

තත් සම්මුතියෙහි ඇතුළත් විධි විධාන කිසිවක් සිය විෂයය ක්ෂේත්‍රයට අයත් වන විට ඒවා ක්‍රියාත්මක කිරීම සලකා බැලීමේදී ඊට සහභාගී වීමට විශේෂිත ආයතනවලට හිමිකම ඇත්තේය. සම්මුතියෙහි ඔවුන්ගේ විෂයය ක්ෂේත්‍රයට අයත් කොටස් ක්‍රියාත්මක කිරීම පිළිබඳව වාර්තා ඉදිරිපත් කරන ලෙස විශේෂිත ආයතනවලට ඇරයුම් කිරීමට කමිටුවට පිළිවන.

VI කොටස

23 වගන්තිය

(අ) පාර්ශ්වකාර රාජ්‍යයක ව්‍යවස්ථාවන්හි හෝ

(ආ) එකී රාජ්‍යය සඳහා බලපවත්නා වෙන ඕනෑම අන්තර්ජාතික සම්මුතියක ගිවිසුමක හෝ ප්‍රතිඥාවක ඇතුළත් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීමට වඩාත් හිතකර කවර හෝ විධි විධානයකට තත් සම්මුතියෙහි ඇතුළත් කිසිවකින් බලපෑමක් නැත්තේය.

24 වගන්තිය

පාර්ශ්වකාර රාජ්‍යයෝ, තත් සම්මුතියෙන් පිළිගෙන ඇති අයිතිවාසිකම් මුළුමනින් සාක්ෂාත් කර ගැනීම අරමුණු කොටගත් සියලු අවශ්‍ය ක්‍රියාමාර්ග ජාතික මට්ටමෙන් ගැනීමට එකඟ වන්නාහ.

25 වගන්තිය

1. තත් සම්මුතිය සියලු රාජ්‍යයන් විසින් අත්සන් තබනු පිණිස පවතිනු ඇත්තේය.

2. තත් සම්මුතිය තැන්පත් කොට තැබෙන ආයතනය ලෙස එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා නම් කරනු ලැබේ.

3. තත් සම්මුතිය සපථ කිරීමට යටත්ව සපථ කිරීමේ ලියකියවිලි එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා භාරයේ තැබිය යුත්තේය.

4. තත් සම්මුතිය සියලු රාජ්‍යයන් විසින් පිළිගනු ලැබීම සඳහා විවෘතව පවතී. පිළිගැනීමේ ලේඛනයක් එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා වෙත තැන්පත් කිරීමෙන් පිළිගැනීම ක්‍රියාත්මක වන්නේය.

26 වගන්තිය

1. එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා වෙත ලිඛිතව කරන දැනුම්දීමකින් කවර හෝ පාර්ශ්වකාර රාජ්‍යයකට කවර හෝ අවස්ථාවක මේ සම්මුතිය සංශෝධනය කරන මෙන් ඉල්ලීමක් කිරීමට පිළිවන.

2. එබඳු ඉල්ලීමක් සම්බන්ධයෙන් ගතයුතු කිසියම් පියවරක් ඇත්නම් එකී පියවර එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් තීරණය කරනු ඇත්තේය.

27 වගන්තිය

1. සපථ කිරීමේ හෝ පිළිගැනීමේ හෝ විසිවැනි ලේඛනය එක්සත් ජාතීන්ගේ මහා ලේකම්වරයා වෙත තැන්පත් කළ දිනට පසු 30 වැනි දවසෙහි සිට තත් සම්මුතිය ක්‍රියාත්මක වන්නේය.

2. සපථ කිරීමේ හෝ පිළිගැනීමේ 20 වැනි ලේඛනය තැන්පත් කිරීමෙන් පසු තත් සම්මුතිය සපථ කරන්නා වූ හෝ පිළිගන්නා වූ හෝ සෑම

රාජ්‍යයක් සම්බන්ධයෙන් ම සම්මුතිය බලාත්මක වන්නේ ස්වකීය සපථ කිරීමේ හෝ පිළිගැනීමේ ලේඛනය තැන්පත් කළ දිනට පසු 30 වැනි දවසේ සිටය.

28 වගන්තිය

1. සපථ කිරීම හෝ පිළිගැනීම හෝ සිදු කෙරෙන අවස්ථාවේදී රාජ්‍යයන් විසින් ඉදිරිපත් කෙරෙන කොන්දේසි එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා විසින් භාරගෙන සියලු රාජ්‍යයන් වෙත යැවිය යුත්තේය.

2. තත් සම්මුතියෙහි අරමුණට සහ පරමාර්ථයට පටහැනි කිසිදු කොන්දේසියකට අවසරය නොලැබෙනු ඇත.

3. එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා වෙත ඕනෑම අවස්ථාවක කෙරෙන දැනුම් දීමකින් කොන්දේසි ඉවත් කර ගත හැකි වන අතර ඔහු විසින් සියලු රාජ්‍යයන් වෙත ඒ බව දන්වා යැවිය යුතු වන්නේය. එවැනි දැනුම් දීම් ඒවා ලැබුණු දින සිට ක්‍රියාත්මක භාවයට පැමිණෙයි.

29 වගන්තිය

1. තත් සම්මුතිය අර්ථ නිරූපණය හෝ භාවිතය හෝ අරභයා පාර්ශ්වකාර රාජ්‍යයන් දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර හටගන්නා වූ ඕනෑම ආරාවුලක් සාකච්ඡා මඟින් විසඳා ගැනීමට නොහැකි වූයේ නම් එක් පාර්ශ්වයක ඉල්ලීම අනුව බේරුම් කිරීම සඳහා යොමු කළ හැක්කේ ය. බේරුම් කිරීම සඳහා ඉල්ලුම් කළ දින සිට හය මසක් ඇතුළත බේරුම්කාර සංවිධානය පිළිබඳව එකඟත්වයකට පැමිණිමට පාර්ශ්වකරුවන් අසමත් වුවහොත් පාර්ශ්වයන්ගෙන් කවරකට හෝ ආරාවුල අන්තර්ජාතික අධිකරණයේ ව්‍යවස්ථාවට අනුකූල ඉල්ලීමක් මඟින් අන්තර්ජාතික අධිකරණය වෙත යොමු කළ හැකිය.

2. තත් සම්මුතිය අත්සන් තබන හෝ සපථ කරන හෝ අවස්ථාවේදී හෝ එය පිළිගන්නා අවස්ථාවේදී හෝ මේ වගන්තියෙහි අංක 1 ඡේදයෙන් තමන් බැඳී නොසිටින බව ප්‍රකාශ කිරීමට කවර හෝ පාර්ශ්වකාර රාජ්‍යයකට පිළිවන. සෙසු පාර්ශ්වකාර රාජ්‍යයන් එවැනි ඉල්ලීමක් කළ පාර්ශ්වකාර රාජ්‍යයක් සමඟ එකී ඡේදයෙන් බැඳෙන්නේ නැත.

3. මේ වගන්තියේ දෙවැනි ඡේදයට අනුව කොන්දේසි ඉදිරිපත් කර ඇති ඕනෑම පාර්ශ්වකාර රාජ්‍යයකට කවර හෝ අවස්ථාවක එක්සත්

ජාතීන්ගේ මහ ලේකම්වරයා වෙත දැනුම් දීමෙන් එකී කොන්දේසිය ඉවත් කර ගැනීමට පිළිවන.

30 වගන්තිය

තත් සම්මුතිය සමාන යථාභූත, අරාබි, චීන, ඉංග්‍රීසි, ප්‍රංශ, රුසියානු සහ ස්පාඤ්ඤ භාෂා පිටපත් සමඟ එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා වෙත තැන්පත් කළ යුත්තේය.